# ධීවර අමාත්‍යාංශය

# ටෙන්ඩර් දැන්වීමයි

# අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටි කුටිය බදුදීම -2024

**ධීවර අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටි කුටිය බදු පදනමට ලබාදීමට මිල ගණන් කැඳවනු ලැබේ.**

**<u>බදු පදනමට ලබා දෙන කුටිය පිළිබඳ විස්තර</u>**

i.දිග අඩි 10.5 පළල අඩි 5

ii.කුටියේ ඉදිරිපස වීදුරු වලින් සකසා ඇති අතර වීදුරු දොරක් සවි කර ඇත.

iii.විදුලි සම්බන්ධතාව ලබාදී ඇත.

Ivකුටිය බිම ටයිල් කර ඇති අතර වහලය තහඩු වලින් යුක්ත වේ.

**ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී ඔබ විසින් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව ටෙන්ඩර්පත් ඉදිරිපත් කල යුතුය.**

1.ටෙන්ඩර් පත් ඉදිරිපත් කල හැක්කේ ධීවර අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ලියවිලි මඟින් පමණි.

2.රු.500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් ධීවර අමාත්‍යාංශයේ දෙවන මහලේ මුදල් අංශයෙන් 2024.08.09 දින පෙ.ව.10.00 සිට 2024.08.21 ප.ව.3.00 දක්වා ටෙන්ඩර් ලියවිලි ලබා ගත හැකිය. මේ සඳහා ස්ථානීය පරීක්ෂාවක් (රාජකාරි දිනයන්හි පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා ) සිදු කල හැකි අතර, වැඩි දුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය වන්නේ නම් **දුරකතන අංක 011-2382285** ඇමතීමෙන් ලබා ගත හැකිය.

3.නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ලියවිලි නව මහලේකම් කාර්යාලය , මාළිගාවත්ත, කොළඹ 10 , දෙවන මහලේ පිහිටි ධීවර අමාත්‍යාංශයේ මුදල් අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදු කල හැකිය.

4. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසන් දිනය 2024.08.22 ප.ව.2.00 වන අතර ටෙන්ඩර් පත් භාර ගෙන අවසන් වූ විගස ටෙන්ඩර් විවෘත කරනු ඇත. එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.නියමිත වේලාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන සියළු ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.බදු ගිවිසුම් කාලය අවුරුදු 02 කි.

6. ටෙන්ඩර් අයදුම් පත්‍රයෙහි, කුටිය බදු පදනම මත ලබා ගැනීමෙන් පසු සිදු කර ගෙන යාමට අපේක්ෂිත ව්‍යාපාරික කටයුත්ත පිළිබඳව කෙටි විස්තරයක් ඇතුලත් කල යුතුය.ප්‍රදේශයට හා මහජන අවශ්‍යතාවයට උචිත ආර්ථික වශයෙන් ඵලදායි ව්‍යාපාර කටයුතු සඳහා විශේෂ ප්‍රමුඛතාවක් ලබා දෙනු ලැබේ.

7.මේ සම්බන්ධයෙන් අවසාන තීරණය ධීවර අමාත්‍යාංශ ලේකම් සතුවේ.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**